**වීරකැටිය ප්‍රාදේශීය සභාව**

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

-----------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

------

මෙම වාර්තාවේ 1.3.2 හා 1.3.6 ඡේදවල දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-----------------------

ගිණුම්කරණ අස්ථිත්වය, වාර්තාකරන කාලපරිච්ඡේදය, ආයෝජන සහ ආයෝජන පොලී සහ ජංගම වත්කම් සහ වගකීම් මෙන්ම ආදායම් හා වියදම් ගිණුම්ගත කිරීම යනාදී කරුණු සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය තුළදී කර්මාන්ත 12 ක් වෙනුවෙන් ගෙවා තිබුණු එකතුව රු.3,231,698 ක වටිනාකම දෙවරක් ගිණුම් ගතකිරීම නිසා ණයහිමි ශේෂය හා සමුච්චිත අරමුදල් ශේෂය පිළිවෙලින් සමාන අගයෙන් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළව ''දොරින් දොරට ගමින් ගමට'' වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 23ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ණයගැති හා ණයහිමි ශේෂ රු. 1,348,575 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබුණු රු. 1,315,770 ක් වූ කර්මාන්ත දෙකක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ආදායමින් හා වියදමින් අත්හැරී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ''දොරින් දොරට ගමින් ගමට'' වැඩසටහන යටතේ අනුමත නොවූ කර්මාන්ත සඳහා රු. 13,095,446 බැගින් ණයගැති හා ණයහිමි ශේෂ ඇති කිරීම නිසා වර්ෂයේ ආදායම සහ වියදම සමාන අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඉ) වලස්මුල්ල කොහොලාන ගලගාවහේන සහ දන්ගහකොරටුව යන ඉඩම්වල රු.200,000 ක් වූ වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ කාර්තු තුනකට අදාළව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.35,304 ක් වූ දායක මුදල් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 7 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.47,769,924 ක අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබිය යුතු ගිණුම්

-------------------

විදේශ අධ්‍යයන චාරිකාවක් වෙනුවෙන් 2009 වර්ෂයේදී දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණු රු. 115,000 ක මුදලින් සභාවට අයවිය යුතු රු. 65,000 ක මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.5 ගෙවිය යුතු ගිණුම්

--------------------

දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින රු. 120,100 ක් වූ ගෙවිය යුතු වැටුප් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.41,893 ක දායක මුදල් නිරවුල් කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

එකතුව රු. 97,859,260 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 5 ක් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයද, එකතුව රු. 1,734,123 ක් වූ හිඟ හිටි කුලී සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛනය හා කාල විශ්ලේෂණද, එකතුව රු. 9,627,185 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛනද, යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**-----------------------------------------------**

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2015 මැයි 21 දිනැති අංක 15/ විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් සභා අරමුදලින් රු. 139,905 ක වියදම් දරා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | කල් ඉකුත් වූ රු. 514,254 ක් වූ තැන්පතු ශේෂ නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදය | යොමුගත විධිවිධාන වලට අනුකූල නොවී සභාව විසින්, බැකෝ යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා රු. 260,472 ක එනම්, සියයට 50 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.5,509,595 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 5,168,404 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 341,191 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ දෙකෙහි මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද, සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා පුනරාවර්තන වියදම්වල සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

(ආ) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි බව පෙන්නුම් කෙරුණි.

(ඇ) ඉකුත් වර්ෂ දෙකට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී, වියදම්වල රු.6,660,296 ක වැඩිවීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

---------------------

**2.3.1 වරිපනම් හා බදු**

-----------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වූ හිඟයෙන් වර්ෂය තුළ සියයට 11 ක් සහ වර්ෂයේ බිල් කිරීම් වලින් සියයට 48 ක් පමණක් අයකර ගැනීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු. 4,366,674 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. කෙසේ වුවද, හිඟ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.2 බදු කුලී**

---------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ හිඟ ශේෂයෙන් වර්ෂය තුළ සියයට 22 ක් පමණක් අයවීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු. 1,734,123 ක් දක්වා වැඩි වී තිබුණි. හිඟ කුලී අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 ඡේදය අනුව, පස්මංහන්දිය, වලස්මුල්ල පොදු වෙළඳපොල, මුදුන සහ වලස්මුල්ල සුපිරි වෙළඳ සංකීර්ණය යන ස්ථානවල පිහිටි කඩ කාමර 49 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 394,765 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.4,785,129 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධන ඇගැයීම**

-------------------------

වාර්ෂික අයවැය ලේඛනය මගින් මාර්ග ඉදිකිරීම් සඳහා රු. 5,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත්, අපේක්ෂිත පරිදි ප්‍රාග්ධන ආදායම් නොලැබීම නිසා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

### 3.2.1 අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම

----------------------------------------

සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභා පොදු අරමුදල් ගිණුමේ මාසික සාමාන්‍ය රු. 6,195,847 ක් පමණ අතිරික්ත මුදල් ශේෂයන් පැවතියද, එම අතිරික්ත මුදල් කෙටිකාලීනව ආයෝජනය කර පොලී ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

### 3.2.2 කාර්ය මණ්ඩල කළමනාකරණය

------------------------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට කාර්ය මණ්ඩලයේ විසිදෙනෙකුගේ අතිරික්තයක් සහ දහතුන් දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

### 3.3.1 අතුරු මාර්ග සංවර්ධනය කිරීම්

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විධිමත් සැලැස්මකට අනුව මාර්ග ඉදිකිරීමට සහ සංවර්ධනය කිරීමට කටයුතු නොකිරීමත්, එම කටයුතු සඳහා සභාව සතු යන්ත්‍ර සහ වාහන යොදවා නොගෙන කුලී පදනම මත යන්ත්‍ර සහ වාහන යොදා ගැනීමත් නිසා රු.1,589,010 ක අමතර වියදම් දැරීමට සිදුවී තිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හි විධිවිධාන වලට අනුකූල නොවී මිල ගණන් කැඳවීමකින් තොරව ට්‍රැක්ටර් හා ටිපර් රථ සැපයීම වෙනුවෙන් බාහිර පාර්ශවයකට රු. 84,000 ක් ද ගෙවා තිබුණි.

### 3.3.2 වාහන නැවතුම් ස්ථාන ඉදි කිරීම

------------------------------------

නව සහ පැරණි කාර්යාල භූමිවල වාහන නවතා තැබීමේ ස්ථාන දෙකක් ඉදි කිරීමේදී, වීරකැටිය සහ වලස්මුල්ල යන පොළ ගොඩනැගිලි වලින් ඉවත් කර සභාවට භාරදී තිබූ ඉතා හොඳ තත්ත්වයේ පවතින අමානෝ තහඩු, ගැල්වනයිස් බට, බොක්ස් බාර් ආදිය යොදා ගැනීමට කටයුතු නොකර, රු. 677,650 ක වියදමින් එම ද්‍රව්‍ය අළුතින් මිලදී ගෙන තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 05 ක එකතුව රු.70,768,343 ක ඉතිරි කිරීම්ද, ආදායම් විෂයයන් 02 ක ළගාකර නොගත් ඉලක්කගත ආදායම් රු.62,965,738 ක් සහ ස්වයං උත්පාදන ආදායම් වලින් සියයට 30 ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර නොතිබීමත් යනාදී හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ. දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයෙහි දක්වා ඇති පරිදි සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. විගණන සැලැස්ම සකස් කිරීමේදී සහ අභ්‍යන්තර විගණන වාර්තා සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි 134 (2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය

--------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය වත්කම්**

----------------

2008 වර්ෂයේදී රු. 6,645,000 ක වියදමින් මිලදී ගෙන තිබූ මාර්ග තලන යන්ත්‍රය 2012 මැයි මාසයේ සිට භාවිතයට යොදවා ගෙන නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම්**

-------------------------

සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් 08 ක සහ සුසාන භූමි 25 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 බේරුම් නොකළ බැරකම්

--------------------------

2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු. 39,628,497 ක් වූ අතර, ඊට වසර 3 ක කාලයක් ඉක්මවා තිබුණු රු. 1,264,510 ක ශේෂයක් සහ වසර 5 ක කාලයක් ඉක්මවූ රු.74,268 ක ශේෂයක්ද ඇතුළත් වී තිබුණි.

## 5. පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය